සියලුම හිමිකම් ඇවිරිණි ]
All Rights Reserved ]

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - බදුල්ල.
Uva Provincial Education Department – Badulla.

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - 2023 පෙරහුරු පරීක්ෂණය
General Certificate of Education (Advanced Level) Examination - 2023 Practice Test

බෞද්ධ ශිෂ්ටාචාරය - II
Buddhist Civilization - II

45 S II

13 ශ්‍රේණිය

කාලය : පැය තුනයි
Time : Three hours

*උපදෙස් :*

- I කොටසින් ප්‍රශ්න දෙකක් ද, II කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

(1). (i) ක්ෂත්‍රිය වර්ණයට අයත් ස්වධර්ම නම් කරන්න. (ලකුණු 02)

(ii) වෛදික සාහිත්‍යයේ දැක්වෙන "ආශ්‍රම ධර්ම" හඳුන්වන්න. (ලකුණු 03)

(iii) චතුර්වර්ණයේ ඓතිහාසික ප්‍රභවය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් ගෙන හැර දක්වන්න. (ලකුණු 04)

(iv) බෞද්ධ ඉගැන්වීම් අනුව අධ්‍යාත්මික සුවය පිණිස කුල හීනත්වය කිසිදු බාධාවක් නොවන බව උදාහරණ දෙකක් මගින් පෙන්වා දෙන්න. (ලකුණු 05)

(v) පවුල් සංස්ථාව තුළ කාන්තාවට බුදු දහමින් හිමිකර දුන් ගෞරවනීය තත්ත්වය පැහැදිලි කරන්න. (ලකුණු 06)

(2). (i) බුදුරජාණන් වහන්සේ අනුත්තර පුරිසදම්ම සාරථී නාමයෙන් හැඳින්වීමට හේතු වූ සාධක දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) බුද්ධ චරිතයෙන් ප්‍රකට වන පද්මාකාර ජීවිතය පිළිබඳව කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 03)

(iii) "ශාස්තෘවරයෙකු වශයෙන් බුදුන් වහන්සේ තුළ පැවැති ආගමික සහනශීලිත්වය උන්වහන්සේගේ ක්‍රියාකාරිත්වය තුළින් ප්‍රකට වෙයි." සනාථ කරන්න. (ලකුණු 04)

(iv) බුදුන් වහන්සේ තුළ පැවැති විශිෂ්ට ගුණාංග සමකාලීනයන්ගේ ඇගයීමට ලක් වූ ආකාරය නිදසුන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(v) ඛේමා රහත් මෙහෙණින් වහන්සේ සතුව පැවැති ගුණාංග පහක් ගෙනහැර දක්වන්න. (ලකුණු 06)

(3). (i) "කායේන සංවරෝ සාධු - සාධු වාචාය සංවරෝ" යන ධම්මපද ගාථාව නිවැරදිව සම්පූර්ණ කරන්න. (ලකුණු 02)

(ii) ඉහත (i) හි සඳහන් කරන ලද ගාථාවේ අර්ථය ලියා දක්වන්න. (ලකුණු 03)

(iii) සිඟාලෝවාද සූත්‍රයට අනුව සේව්‍ය සේවක යුතුකම් හා වගකීම් ගෙනහැර දක්වන්න. (ලකුණු 04)

(iv) සමාජ සංවර්ධනයට අනුබල දෙන, දෙලොවටම යහපතක් සලසන ඉතා වැදගත් උපදෙස් මාලාවක් මංගල සූත්‍රයේ සඳහන් වේ. එම සූත්‍රයේ කරුණු පහක් ඇසුරින් පහදන්න. (ලකුණු 05)

(v) වර්තමාන ආර්ථික අර්බුද පිළිබඳව අවධානය යොමු කරමින් ආර්ථික සුරක්ෂිතතාව සඳහා අදාළ වන බෞද්ධ ආර්ථික සංකල්ප හඳුන්වා දෙන්න. (ලකුණු 06)

## II කොටස

(4). (i) "සදාචාරවත් සමාජයක් බිහි කරගැනීමෙහිලා නීති ගරුක වීම මෙන්ම පුද්ගලයාගේ ආධ්‍යාත්මික ශික්ෂණය ද එක සේ බලපායි." බෞද්ධ ඉගැන්වීම් අනුව පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) නූතන සමාජ ගැටළු අවම කර ගැනීම සඳහා පංචශීල ප්‍රතිපදාව උපයෝගී කරගත හැකි ආකාරය උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 10)

(5). (i) බුද්ධ කාලීන භාරතයෙහි සීඝ්‍රයෙන් බුදුසමය ව්‍යාප්ත වීමට හේතු වූ සාධක ගෙනහැර දක්වන්න. (ලකුණු 10)

(ii) කලා රසවින්දනය ප්‍රබුද්ධ හා සංවේදී මිනිසකු සතු උසස් ගුණාංගයක් බව සෞන්දර්ය රසාස්වාදය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් අනුසාරයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(6). (i) බුරුමය (මියන්මාරය) හා ශ්‍රී ලංකා සබඳතා දෙරටේ බුදු දහමේ පෝෂණයට ඉවහල් වූ අයුරු විග්‍රහ කරන්න. (ලකුණු 10)

(ii) "ධර්මාශෝක අධිරාජයා බෞද්ධ නරපතියෙකි." කරුණු දක්වමින් සනාථ කරන්න. (ලකුණු 10)

(7). (i) වික්‍රමශිලා විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන ව්‍යුහය හා පරිපාලන ව්‍යුහය විස්තර කරන්න. (ලකුණු 10)

(ii) ප්‍රාග් මගින් ද යුගයේ ශ්‍රී ලංකාවේ පැවැති ජන ඇදහිලි හා විශ්වාස ඓතිහාසික මූලාශ්‍රයන් ඇසුරින් පෙන්වා දෙන්න. (ලකුණු 10)

(8). (i) අභයගිරි සම්ප්‍රදායේ ප්‍රභවය ශ්‍රී ලාංකික ආගමික හා දේශපාලන ඉතිහාසය තුළ ව්‍යාකූලත්වයක් නිර්මාණය වීමෙහිලා පාදක වූ අයුරු ඓතිහාසික සාධක මගින් විමසීමට ලක් කරන්න. (ලකුණු 10)

(ii) "පටිමා ඝරය" හා තදනුබද්ධ කලා නිර්මාණ වල ශ්‍රී ලාංකේය අනන්‍යතාවය ප්‍රකට වන්නේදැයි විමර්ශනය කරන්න. (ලකුණු 10)